ජාතික අයවැය දෙපාර්තමේන්තුව
தேசிய வரவுசெலவுத்திட்டத் திணைக்களம்
DEPARTMENT OF NATIONAL BUDGET

මහා භාණ්ඩාගාරය
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

பொதுத்திறைசேரி
நிதி, திட்டமிடல் அமைச்சு
கொழும்பு 01.

General Treasury
Ministry of Finance and Planning
Colombo 01.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் அதிபதி / Director General } 2484665, 2484639 (Fax)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர் அதிபதி / Additional Director General } 2484666, 2484667
කාර්යාලය / அலுவலகம் / Office } 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax } 2484691
Web site: www.treasury.gov.lk
e-mail:budget@nbd.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No. : බිඩ්/පිඹිබ්/පිඑල්පස්/1
ඔබේ අංකය / உமது இல / Your No. :
දිනය / திகதி / Date : 2007.06. 15

අයවැය චක්‍රලේඛ අංක : 130 (II)

අමාත්‍යාංශ ලේකම් වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම් වරුන්,

<u>දේපළ ණය බැංකු මගින් ලබා දීම - ගිණුම් තැබීමේ උපදෙස්</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් 2006.06.28 වන දිනැති අයවැය චක්‍රලේඛ 130 හා 2007.02.14 වෙනි දිනැති අයවැය චක්‍රලේඛ 130 (1) චක්‍රලේඛනවල සඳහන් ගිණුම් උපදෙස් වලට .අමතරව පහත සඳහන් ගිණුම් උපදෙස්ද 2007.06.15 වන දින සිට ක්‍රියාත්මක කළ යුතුවේ.

1. රජයේ සේවකයින්ගෙන් අයකරනු ලබන පොලිය.

(අ) 2007.06.15 වන දිනට පෙර රජයේ සේවකයින්ට බැංකුවෙන් නිදහස් කළ සම්පූර්ණ ණය මුදල හෝ ණය මුදලෙන් නිදහස් කළ කොටස සඳහා එම ණය මුදල ගෙවා අවසන් වනතුරු සේවකයාගෙන් අයකළ යුතු පොලිය 4% කි.

(ආ) 2007.06.15 වන දිනට පෙර ණය මුදලකින් කොටසක් ලබාගෙන එම ණය මුදලේ ඉතිරි කොටස 2007.06.15 වන දිනෙන් පසු බැංකුවෙන් ලබාගන්නේ නම් එම ණය කොටස සඳහා අදාල පොලිය 2007.06.12 වන දින දරණ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 15/2007 හි 1.2.2 වන වගන්තියට අනුකූලව පොලී අයකළ යුතුය. ඔබගේ පහසුව සඳහා බැංකුව වර්ෂයකට 14.5% ක් පොලියක් අයකරන විට පොලී ගණනය පහත ආදර්ශ යන් මගින් දක්වා ඇත.

| | අනුමත ණය මුදල (රු.) | 2007.06.15 පෙර ලබාගත් ණය මුදල (4% පොලිය අදාල වේ) (රු.) | 2007.06.15 පසු ලබාගත් ණය මුදල (රු.) | 2007.06.15 න් පසු ලබාගත් ණය වල පරාසයන් (රු.) | 2007.06.15 පසු ලබාගත් ණය සඳහා ණයලාභියා-ගෙන් අයකළ යුතු පොලී අනුපාතය | 2007.06.15 පසු ලබාගත් ණය සඳහා රජය විසින් දැරිය යුතු පොලිය |
|---|---|---|---|---|---|---|
| උදාහරණ 1 | 1,350,000/- | 350,000/- | 1,000,000/- | (1) පළමු 150,000/- දක්වා | 4% | 10.5% |
| | | | | (2) දෙවන 500,000/- | 8% | 6.5% |
| | | | | (3) තෙවන 350,000/- | 11% | 3.5% |
| උදාහරණ 2 | 1,400,000/- | 650,000/- | 750,000/- | (1) පළමු 350,000/- | 8% | 6.5% |
| | | | | (2) දෙවන 400,000/- | 11% | 3.5% |

(ඇ) 2007.06.15 වන දිනෙන් පසු බැංකු මගින් ණය ඉල්ලුම් පත්‍රයක් සඳහා නව ණයක් ලෙස මුදල් නිදහස් කරන විට 2007.06.12 වන දිනැති රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 15/2007 හි 1.2.2 වන වගන්තියට අනුකූලව පොලී අයකළ යුතුය.

(ඈ) 2007.06.15 වන දිනෙන් පසු බැංකු විසින් නිදහස් කරන මුදල් වෙනුවෙන් සේවකයින්ගෙන් ණය වාරික අයකිරීමේදී අවම පොලියට අදාල ණය මුදල පළමුවෙන් අයවන ආකාරයට සේවකයාගෙන් අයකල යුතු පොලිය ගණනය කළ යුතුවේ. ඔබගේ පහසුව සඳහා පහත ආදර්ශයන් දක්වා ඇත.

උදා: I. **සේවකයා ලබාගත් ණය මුදල රු. 750,000/- ක් හා මාසික පොලිය සහ ණය මුදලෙන් අඩුකළ මුදල ඇතුලත් මාසික වාරිකය රු. 12,500/- ක් නම්**

බැංකුව අයකරනු පළමු වාරිකය රු.12,500/-
(බැංකු පොලිය රු.9,063/- ණය මුදලින් අඩුකිරීම් රු.3,437/-)
සේවකයාගෙන් අයකළ යුතු පොලිය රු. 3,333/-
(පොලිය ගණනය කොට ඇත්තේ පළමු රු.500,000/- ට 4% බැගින් හා දෙවන රු. 250,000/- ට 8% බැගිනි.)
රජය විසින් දැරිය යුතු පොලී සහනාධාරය රු. 5,730/-

ඒ අනුව වාරිකය පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| ණය මුදලින් අඩුකිරීම් | රු. | 3,437.00 |
| රජයේ පොලී සහනාධාරය | රු. | 5,730.00 |
| සේවකයාගෙන් අයකළ යුතු පොලිය | රු. | 3,333.00 |
| එකතුව | රු. | 12,500.00 |

II. පළමු වාරිකයෙන් පසු ණය මුදල රු.746,563/-
බැංකුව අයකරනු දෙවන වාරිකය රු.12,500/-
(බැංකු පොලිය රු.9,022/- ණය මුදලින් අඩුකිරීම් රු.3,478/- )
සේවකයාගෙන් අයකළ යුතු පොලිය රු. 3,323/-
පොලිය ගණනය කොට ඇත්තේ පළමු රු. 496,563/- ට 4% බැගින් හා ඉතිරි රු. 250,000/- ට 8% බැගිනි.)
රජය විසින් දැරිය යුතු පොලී සහනාධාරය රු.5,699/-

ඒ අනුව වාරිකය පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| ණය මුදලින් අඩුකිරීම් | රු. | 3,478.00 |
| රජයේ පොලී සහනාධාරය | රු. | 5,699.00 |
| සේවකයාගෙන් අයකළ යුතු පොලිය | රු. | 3,323.00 |
| එකතුව | රු. | 12,500.00 |

2. බැංකු සඳහා ගෙවිය යුතු පොලිය

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 15/2007 හි 1 වන වගන්තියට අනුව :

I. 2007 ජුනි 15 වන දිනට පෙර බැංකුව විසින් දේපල ණය වෙනුවෙන් නිදහස් කර ඇති ණය මුදල් වලට අදාල බැංකුවලට ගෙවිය යුතු වාර්ෂික පොලී අනුපාතිකය වන 11% , තවදුරටත් නොවෙනස්ව පවතිනු ඇත.

II. 2007.06.15 වන දිනට පසු බැංකුව දේපල ණය වෙනුවෙන් නිදහස් කරන මුදල් සඳහා භාණ්ඩාගාරය නැවත දැනුම් දෙන තුරු වර්ෂයකට 14.5% පොලියක් බැංකු වෙත ගෙවිය යුතුය.

III. යම්කිසි පුද්ගලයෙකු 2007.06.15 වන දිනට පෙර ණය මුදලෙන් කොටසක් ලබාගෙන ණය මුදලේ ඉතිරි කොටස 2007.06.15 පසු බැංකුවෙන් නිදහස් කර ගත්තේ නම් එම කාල පරිච්ඡේද දෙකට අදාල බැංකුව වෙත ගෙවිය යුතු පොලී අනුපාතිකයන් එකිනෙකට වෙනස් වන බැවින් (පිළිවෙලින් 11% සහ 14.5%) ණය මුදල් දෙකක් වශයෙන් සලකා බැංකුවෙන් වෙත වෙනම ණය වාරිකයන් පිළිබඳ විස්තර ලබාගත යුතුය. එවැනි ණය වාරික පියවීමේදී බැංකුව දෙනු ලබන උපදෙස් අනුව පියවීම් කල යුතු වේ.

3. 2007.06.15 පසු නිදහස් කළ ණය වෙනුවෙන් අදාල වාරිකය හා එයට අදාල පොලී පිළිබඳ විස්තර ලබාගැනීම හා ගිණුම් තැබීම :

I. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සේවකයාගෙන් අයකල යුතු පොලිය හා රජය විසින් දැරිය යුතු පොලී සහනාධාරය තීරණය කිරීම සඳහා මෙම චක්‍රලේඛයට අමුණා ඇති උපලේඛණ 1 ට අනුකූලව බැංකුවෙන් සෑම වර්ෂයකටම අදාල විස්තර ලබාගත යුතු වේ.

II. මෙම චක්‍රලේඛයේ උපලේඛණ අංක 1 ට අනුකූලව ලබාගත් තොරතුරු මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/2007 හි 1.2.2 වගන්තියට අනුව හා මෙම චක්‍රලේඛයේ 1 (ආ) හා (ඇ) වගන්ති වලට අනුකූලව රජය විසින් ගෙවිය යුතු පොලී සහනාධාරය හා සේවකයාගෙන් අයකල යුතු පොලිය නිවැරදිව ගණනය කිරීම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල විෂය භාර නිලධාරීන්ගේ වගකීම වේ.

III. 2006.06.28 වන දින දරණ අයවැය චක්‍රලේඛ 130 හි හා 2007.02.14 දින දරණ අයවැය චක්‍රලේඛ 130(1) ට අනුකූලව ගිණුම් තැබීම සිදුකල යුතු වේ.

4. මෙම චක්‍රලේඛයේ උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී යම් ප්‍රායෝගික ගැටළුවක් ඇත්නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඒ පිළිබඳව ලිඛිත උපදෙස් ලබාගත යුතු වේ.

සුධර්මා කරුණාරත්න
ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :

1. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
2. සියළුම පලාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
3. අධ්‍යක්ෂ ජනරාල්- භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
5. විගණකාධිපති.

උපලේඛන අංක : 01

.......................................
.......................................
....................................... (ලිපිනය)

## ණය වාරික හා පොලී අයකිරීම පිළිබඳ මාසික විස්තර ලබාදීම

1. නිලධාරියාගේ නම : ..........................................................................
2. ණය හිමිකම් අංකය : ..........................................................................
3. සේවා ස්ථානයේ ලිපිනය : ..........................................................................
..........................................................................
4. ප්‍රදානය කල ණය මුදල : රු. ..........................................................................
5. ....................................... දිනට ගෙවීමට ඇති ණය මුදලේ ඉතිරි ශේෂය රු. .................

| වර්ෂය | මාසය | මාසික ණය වාරිකය (පොලිය හා ණය මුදලින් අඩුවන ප්‍රමාණය) | මාසිකව අයවන පොලිය (වර්ෂයකට14.5% බැගින් ) | මාසිකව ණය මුදලින් අඩුවන මුදල | මාසය අවසානයේ ගෙවීමට ඇති ණය මුදලේ ඉතිරිය |
|---|---|---|---|---|---|
| | ජනවාරි | | | | |
| | පෙබරවාරි | | | | |
| | මාර්තු | | | | |
| | අප්‍රේල් | | | | |
| | මැයි | | | | |
| | ජූනි | | | | |
| | ජූලි | | | | |
| | අගෝස්තු | | | | |
| | සැප්තැම්බර් | | | | |
| | ඔක්තෝම්බර් | | | | |
| | නොවැම්බර් | | | | |
| | දෙසැම්බර් | | | | |

බැංකු කළමනාකරු

දිනය :